www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද බැංකු වලට ඇපදීමේ වියදම ඩොලර් ට්‍රිලියන 23.7 කි

## US bank bailout to cost $23.7 trillion

**ඇන්ඩ්‍රි ඩිමෝන් විසිනි**

**2009 ජුලි 22**

**භා**න්ඩාගාරයේ ඇපදීමේ ක්‍රියාවලිය අධීක්ෂනය කරන ප්‍රධානියා විසින් පසුගිය 20 වන දින කොන්ග්‍රසයට කල ප්‍රකාශයකට අනුව, ෆෙඩරල් ආන්ඩුවේ වෝල් වීදියට ඇප දීමේ වැඩ සටහන ඩොලර් ට්‍රිලියන 23.7 ක් වනු ඇත. අර්බුදයට පත් වත්කම් වලට සහන සැලසීමේ වැඩ පිලිවෙලෙහි (ටීඒආර්පී) විශේෂ අධිපති නීල් බැරොෆ්ස්කි එක්සත් ජනපද මහබැංකුවේ ඇප දීමේ වැඩපිලිවෙල, "එකිනෙකට ගැටෙන ආසක්තයන්ගෙන් හා මතභේදයට තුඩුදෙන දුබලතාවලින්" ගහන බවත්, බැංකු ආන්ඩුවෙන් ලබාගන්නා මුදල් වලින් කුමක් කරන්නේ ද යන්න හිතාමතාම වසං කර ඇති බවත්, කියා සිටියේ ය. ඇපදීමට සම්බන්ධ ප්‍රධාන වංචා විමර්ෂන 35 ක් පැවැත්වෙන බවත් බැංකු වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් ඔවුන්ට ලැබුනු ඇප අරමුදල්, අලුතින් නය නිකුත් කිරීම සඳහා යොදාගෙන නොමැති බවත් ඔහු පෙන්වාදී ඇත.

සැබවින්ම බැංකු ආන්ඩුවෙන් මුදල් උපයාගත් බව කියා සිටින බැරොව්ස්කිගේ කරුනු දැක්වීම තුල, ට්‍රිලියන 23 ක මුදල් සම්භාරයට, බැංකු විසින් ආන්ඩුවේ නය ආපසු ගෙවීමට යොදාගත් මුදල් පිලිබඳව නිවැරදි ගිනුම් ඇතුලත් කිරීමට අසමත් වී ඇතැයි කියා සිටිමින් භාන්ඩාගාරය, ඔහුගේ නිරීක්ෂන වහාම ප්‍රතික්ෂේප කලේය.

බැරොව්ස්කිගේ වාර්තාව ආන්ඩුවේ ආයතනයක කටයුතු පිලිබඳ වාර්තාවකට වඩා මුදල් ගසාකෑමේ ක්‍රියාවලියක් පිලිබඳ පොලිස් ලිපිගොනුවකට සමාන වේ. ඇප දීමේ ක්‍රියාවලියෙහි විශාල කොටසක් අධීක්ෂනය කිරීමේ වගකීම භාර ආන්ඩුවේ ශාඛාවක් වන භාන්ඩාගාරය, වැඩි විනිවිදභාවයක් හා දැඩි වාර්තාකරන ප්‍රමිතීන් පිලිබඳව තමන්ගේම කාර්යාලයෙන් පවා, ඉදිරිපත් කල ඉල්ලීම් වලට එක දිගට විරුද්ධ වී තිබේ යයි ඔහු ප්‍රකාශ කරයි.

"ටාප් (ටීඒආර්පී) යන්න බදු ගෙවන්නන්ගෙන් පහත සඳහන් දේ වසංකල යුතු බවට එකඟවූ ක්‍රියා මාර්ගයක් බවට පත්ව තිබෙන බව එහි සඳහන් වේ. 1. ටාප් ලාභීන්ගෙන් බොහොමයක් තමන් ලබාගත් මුදලින් කුමක් කරන්නේ ද යන්න 2. ඔවුන්ගේ ආයෝජන වලින් සැලකිය යුතු කොටසක් කෙතරම් වටිනාකමකින් යුක්ත ද යන්න 3. ඔවුන්ගේ මුදල් ආයෝජනය කරන්නේ කෙසේ ද යන්න පිලිබඳ සම්පූර්න විස්තර ප්‍රසිද්ධ කිරීම"

පිහිටවූ තැන් පටන් මාස 9 ක් ගතවී ඇති එම 'දුෂ්කරතාවන්ට මුහුනපාන වත්කම්වලට සහන සැලසීමේ වැඩපිලිවෙල' යටතේ "එක්සත් ජනපද භාන්ඩාගාරය ට්‍රිලියන 3 ක් පමන වටිනාකමකින් යුත් ආන්ඩුවේ හා පෞද්ගලික අරමුදල් වලට සම්බන්ධ වැඩ සටහන් 12 ක් නිර්මානය කර" ඇතැයි එම වාර්තාව සඳහන් කරයි. භාන්ඩාගාර වැඩ කටයුතු වලට අමතරව සමස්තයක් ලෙස එක්සත් ජනපද ආන්ඩුව ම "ට්‍රිලියන 23.7 ක් දක්වා ඉහල නැඟිය හැකි ආධාර" වැඩ සටහන් "දූසිමක්" තරම් වත් ක්‍රියාවට නඟා තිබේ.

කොන්ග්‍රසය විසින් භාන්ඩාගාරයට වෙන්කර ඇත්තේ ඩොලර් 700,000 ක් වුවත් පාඩු ලබන අවස්ථාවක දී ආන්ඩුව බැංකු වලට ලබා දී ඇති සහතික පිලිබඳව මතුවන තොරතුරු ද සමඟ ගත් කල භාන්ඩාගාරයට ඇති ශක්‍ය බැඳීම්වල මුලු එකතුව ට්‍රිලියන 2.3 හා 2.8 අතර වනු ඇති බව වාර්තාව පෙන්වා දෙයි. ආරම්භයේදී ප්‍රාග්ධන මිලට ගැනීමේ වැඩ සටහන (සීපීපී) ලෙස හඳුන්වන ක්‍රියාමාර්ගයට එන්නත් කල බිලියන 218 ද ඇතුලුව, ඇමරිකන් ඉන්ටනැෂනල් ග්‍රෑප් රක්ෂන සමාගම හා, ඩොලර් ට්‍රිලියනයක් දක්වා ශක්‍ය බැඳීම් සහිත වත්කම්වල පිටුබලය සහිත නය පහසුකම් (ටීඒඑල්එෆ්) හා ආන්ඩුවේ හා පුද්ගලික ආයෝජන වැඩ සටහන් (පීපීඅයිපී) යන වත්කම් යලි මිලට ගැනීමේ ප්‍රමුඛ වැඩ සටහන් දෙක වැනි ස්වාධීන ආයතන වලට සෘජුව ම ඇප දීම සඳහා ටාප්, දූසිමක පමන කොටස් වලට බෙදා තිබේ. බැරොෆ්ස්කි සඳහන් කලේ සිය ආරම්භක යෝජනාවලින් එකක් වූයේ "ටාප් ලාභීන් සියලු දෙනා එහි අරමුදල් ප්‍රයෝජනයට ගන්නා ආකාරය වාර්තා කිරීම අවශ්‍ය බවයි. එවන් වාර්තාකරනයක් 'අර්ථ විරහිත' බව ප්‍රකාශ කරමින් භාන්ඩාගාරය ඒ සියලු නිර්දේශ ඉවත දමා ඇතැයි ද භාන්ඩාගාරයේ තර්කය විකාරයක් බව ද ඔහු සඳහන් කරයි. බැංකුවල අතිරේක අරමුදල් ඒවායේ තීන්දු ගැනීම කෙරෙහි බලපා

තිබෙන්නේ කුමන ආකාරයට ද යන්න හෙළිදරව් කරන ලෙසට බැංකු නම්මා ගැනීම පහසුවෙන්ම කල හැකිය. මුදල් වලින් ඔවුන් කරන්නේ කුමක් ද යන්න හෙලිකරන ලෙසට බැංකු වලට බල නොකිරීමේ භාන්ඩාගාරයේ දඩබ්බරකම අන් කිසිවක් නොව බැංකු විශාල සංඛ්‍යාවක් තම නයදීම් හකුලුවා ඇති බවත්, පාරිභෝගික නය සඳහා ගාස්තු හා පොලී අනුපාත ඉහල නංවා ඇති බවත්, තියුනු ලෙස සමාජ ආසක්තයන්ට පටහැනිව යන ප්‍රතිපත්ති අනුගමනය කර ඇති බවත් යන කාරනා වසංකිරීමකි. ඇත්ත වශයෙන්ම සමීක්ෂනය කල බැංකු 300 කින් සියයට විස්සක්ම අරමුදල් ලබාගැනීමෙන් පසුව සිය නය දීම් ඉහල දමා නැති බවත් ඇප දීමේදී ලත් අතිරේක මුදල් වෙනත් අරමුනු සඳහා යොදවා ඇති බවත් වාර්තාවෙන් හෙලිකර තිබේ. ටාප් වැඩ සටහනට අදාල වංචා හා දූෂන සම්බන්ධ සිද්ධීන් 35 ක් දැනට විශේෂ පරීක්ෂකවරයාගේ කාර්යාලයේ පරීක්ෂනයට යොමුවී ඇති බවත් එහි සඳහන් වේ.

ටාප් හා පීපීඅයිපී යන දෙකටම අදාල ඇපදීමේ වත්කම් සම්භාරයේ වටිනාකම වාර්තාගත කිරීමට පටන් ගන්නා ලෙසට කෙරෙන ඉල්ලීම් භාන්ඩාගාරය විසින් ප්‍රතික්ෂේප කර ඇති බව ද බැරොෆ්ස්කි තව දුරටත් කියා ඇත. මූලික වැඩපිලිවෙල ඉදිරියට ගෙනයාම වෙනුවෙන් ඉදිරිපත් කල යුක්තිකරනය, "ද්‍රවශීලතා සුරැකුම්" සඳහා "මිල සොයාගැනීම" යන තර්කය වූ තාක් දුරට, විස සහිත වත්කම් මිලට ගැනීමේ ආන්ඩුවේ වැඩ සටහනේ අඩංගු ක්‍රමවේදය, ප්‍රකට ලෙසම වැඩ සටහනේ අරමුනු වලට පටහැනි බව වාර්තාව පැහැදිලි කරයි.

"එකිනෙකට ගැටෙන ආසක්තයන් හා මතභේදයට තුඩුදෙන දුබලතා, පීපීඅයිපී වැඩ සටහන සැලසුම් කල ආරම්භයේ පටන්ම නොවැලැක්විය හැකි ලෙසම ඒ තුල අන්තර්ගතව පැවතුනු" අතර, බොහෝ අවස්ථාවල දී ද්‍රවශීලතාවයෙන් තොර වත්කම් අගයකිරීම භාරගත් එම ව්‍යාපාර ම ෆෙඩරල් ආධාර ලබාගැනීමේ ප්‍රතිපලය වූයේ ඒවා සුරැකුම් අධිප්‍රමානය කිරීමට ලැබුනු දිරිගැන්වීමක් බවට පත්වීමය.

සමහර සමාගම් වලට පීපීඅයිඑෆ් කලමනාකාර තත්ත්වය පිරිනැමීම මඟින් සමස්තයක් ලෙස වෙලඳපොලෙන්ම හා ඇමරිකානු බදු ගෙවන්නන්ගෙන් වියෝකරනු ලැබූ සමාගම් දුසිම් ගනනක වියදමෙන්, තෝරාගත් අතලොස්සකට වාසි සැලසීම් වස්, "පරාජිතයන් හා ජයග්‍රාහකයන් වෙන්කර ගැනීමට, භාන්ඩාගාරය ටාප් වැඩ සටහන ප්‍රයෝජනයට ගන්නා'' බවට වාර්තාව යලි යලිත් චෝදනා නගා ඇත.

මේ කිසිවක් අහම්බයන් නොවේ. ගෝල්ඩ්මන් සැක්ස් වැනි දේශපාලන බලපෑම් සහිත බැංකු හා ආයෝජන සමාගම් සිය තරගකරුවන් පලවා හැරීමටත්, මූල්‍ය පද්ධතිය මත සිය ඒකාධිකාරය ශක්තිමත් කර ගැනීමටත් ඇපදීම් ප්‍රයෝජනයට ගෙන ඇති බව හොඳින්ම සටහන්ව ඇති කාරනයකි.

තව ද, වැඩ සටහනේ විනිවිදභාවයක් නොමැතිකම ආන්ඩුව ප්‍රයෝජනයට ගෙන ඇත්තේ, බැංකු වලට නිදහස් බලපත්‍රයක් ලබාදෙමින් දැන් එවා ලාභදායී තත්වයට පත් කොට තිබීමේ කාරනය වසං කිරීම සඳහාය. ටාප් අධීක්ෂනය කරන තවත් ආයතනයක් වන කොන්ග්‍රස් අධීක්ෂන මඬුල්ල, ආන්ඩුවේ නය ආපසු ගෙවීමට අපේක්ෂිත බැංකු වලින් ආන්ඩුවට ලැබෙන්නේ ඩොලරයක් සඳහා ශත හැටක් පමනක් බව මේ මාසයේදී අනාවරනය කරන ලදී.

ඇපදීමේ සම්පූර්න වියදම ඩොලර් ට්‍රිලියන 23 ක් බවට කෙරෙන වාර්තාවේ තක්සේරුව මත් සිත් සසල කරන සුලුය. එය සමස්ත එක්සත් ජනපදයේ ම දල ජාතික නිෂ්පාදිතය මෙන් 1.7 ගුනයකට සමානය. වෙනත් වචන වලින් කිවහොත් සියලු ඇමරිකානු කම්කරුවන්ගේ මුලු වසරක ම ශ්‍රම නිමැවුමට වඩා වැඩි කොටසක් කෙලින්ම බැංකු වලට මාරුකර යවා ඇති බවයි. මෙම සංඛ්‍යා ඉදිරිදර්ශනයක් තුල තැබුව හොත් අධ්‍යාපනය, ආහාර හා පෝෂන වැඩ සටහන් හා නිවාස හා නාගරික සංවර්ධනය වැනි ආන්ඩුවේ පලදායී වියදම් වල සමස්ත පිරිවැය වසරකට එක් ට්‍රිලියනයකටත් වඩා අඩු ය.

ධනයේ දැවැන්ත මාරුව සමාජයේ අති මහත් බහුතරයක් කාලකන්නිකමට හා දරිද්‍රතාවයට ඇද දැමීමකි. බැංකුවලට ඇප දීමේ ක්‍රියා පිලිවෙත පුලුල් ලෙස ගැරහීමට ලක්ව ඇතුවාක් මෙන්ම ඉන් වාසි ලැබූ බැංකු කරුවන් දැකගනු ලබන්නේ අපරාධකරුවන්ට නොඅඩු පිරිසක් ලෙසය. මේ සියල්ල පුපුරන සුලු ඇඟවුම් ගැබ්කර ගනියි. මේ කාරනය නිහඬව හඳුනාගෙන තිබීම සලකුනු කරමින්, භාන්ඩාගාරය නිර්ලජ්ජිත ලෙස සොරකමේ යෙදීම පිලිබඳව වාර්තාව මෙසේ අනතුරු අඟවයි. භාන්ඩාගාරයේ කටයුතු මඟින් "ටාප් වෙත, තවත් දුරට ගිය විට ඔවුන්ගේ ආන්ඩුව වෙත පවා, ඇමරිකානු ජනතාව තබා ඇති අඩමාන විශ්වාසය, විනාශයක හෙලිය හැක."

ආර්ථික අර්බුදයට සහන සලසන්නේය යන කඩතුරාව යටතේ බැංකු ඇප දීම මුල සිටම සැලසුම් කරන ලද්දේ සියල්ලන්ගේ ම වියදමෙන් මූල්‍ය ප්‍රභූ පැලැන්තිය පොහොසත් කිරීම සඳහා ය. වැඩ සටහනේ අනුග්‍රහ දැක්වීම්, එකිනෙකට ගැටෙන ආසක්තයන් හා දැවැන්ත කඩතොලු, නොඑසේ නම් පලදායී ක්‍රියාමාර්ගයක රලු වැරැද්දක් නොව එහි අරමුනට ම මනාව ගැලපෙන්නකි. සියලු දෙයම ඓතිහාසික පරිමානයේ අපරාධයකි.

© www.wsws.org